**ශීර්ෂය 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 13 දින කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශ ගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි** | **මුදල් රෙගුලාසි 127 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයන්ට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.2.1 |
| | | 2. ලේඛන හා පොත් පවත්වා නොතිබිම | 2.10 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ අඩුපාඩු | 2.6 |
| | | 2. විසඳා නොතිබුණු විගණන ඡේද | 2.5 |
| | | 3. විගණන හා කළමනාකරණ කමිටු නොපැවත්වීම. | 2.13 |
| | | 4. සේවක පුරප්පාඩු පිරවීම. | 2.14 (අ) |
| | | 5. කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීම. | 2.14 (ආ) |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3 |
| | | 2. අභ්‍යන්තර විගණනය | 2.12 |

| | | | |
|---|---|---|---|
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරිම | 2.2.3 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.7 |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම. | අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුමේ වූ අඩුපාඩු | 2.9 |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.15 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරයන්

------------------------------------------

(අ) 1954 අංක 11 දරන අල්ලස් පනත සංශෝධනය කරන ලද වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය යටතේ අල්ලස් හෝ දූෂණ සහ අයථා ලෙස වත්කම් අත්පත් කර ගැනීමේ වැරදි සම්බන්ධව විමර්ශනය කිරීම.

(ආ) අල්ලස්, දූෂණ හා වත්කම් අත්කර ගැනීමේ වැරදි සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් සහ මහාධිකරණයන්හි අල්ලස් පනත යටතේ නඩු පැවරීම හා නඩු මෙහෙයවීම.

(ඇ) අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉදිරිපත් වන අභියාචනා නඩු සඳහා අවශ්‍ය පරිදි ක්‍රියා කිරීම.

(ඈ) අල්ලස් හා දූෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙහෙයවීම තුළින් අල්ලස් නිවාරණය සඳහා කටයුතු කිරීම

### 2.2 කාර්යසාධනය

----------------

#### 2.2.1 සැලැසුම් කිරීම

----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම එකී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. සභාවේ අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් 04 ක් ඉටු කර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැසුම (Activity Plan), ක්‍රියාත්මක කළ කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන සැලැස්ම (Internal Audit Plan) පිළියෙල කර නොතිබුණි.

#### 2.2.2 ආරම්භ නොකල කාර්යයන්

---------------------------------

2017 වර්ෂය සඳහා වූ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රථගාල පුළුල් කිරීමේ කාර්යය සඳහා රු.මිලියන 3 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යය ආරම්භ කර නොතිබුණි.

## 2.2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2018 ජූලි 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, වැඩ කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමේදී විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදුකළ යුතු වුවත් 2017 වර්ෂයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබූ ගොඩනැගිලි හා ඉදිකිරීම් - පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් යටතේ ව්‍යාපෘති 04 ක් සම්බන්ධයෙන් එලෙස ලිඛිත එකඟතාවයකට හෝ ගිවිසුමකට එළැඹ නොතිබුණි. තවද එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 03 ක්ම 2017 වර්ෂය තුළ නිම කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (1) මාර්ගෝපදේශය ප්‍රකාරව, වැඩ කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් ගෙවීම් සඳහා පිළිගත හැකි අත්තිකාරම් ගෙවීම් සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත කොන්ත්‍රාත් මුදලින් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සියයට විස්සක (20%) උපරිමයක් පමණක් ගෙවිය හැකිය. එසේ වුවත් පැරණි දෙමහල් ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 1.48 ක (බදු සහිත) ඇස්තමේන්තුවක් පදනම් කරගෙන, ඇස්තමේන්තු වටිනාකම ඉක්මවා රු. මිලියන 1.5 ක අත්තිකාරම් මුදලක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.1.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදනයන් සඳහා තාක්ෂණික ඇගැයීම් කමිටු පත් කළ යුතු වුවත් කොමිෂන් සභාව විසින් වැටුප් පත්‍රිකා මුද්‍රණ යන්ත්‍රය හා පරිගණක උපාංග ප්‍රසම්පාදනයේ තාක්ෂණික ඇගැයීම් කමිටු පත්කර නොතිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.2 (11) මාර්ගෝපදේශයෙහි සඳහන් පරිදි සේවක පිරිස්, උපකරණ වැනි සම්පත්ද ඉදිකිරීමේ සහ නිෂ්පාදනය කිරීමේ පහසුකම්ද පවත්නා බවට ලංසු කරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂාවේදී සලකා බැලිය යුතු විය. එසේ වුවත්, කොමිෂන් සභාවේ 2017/2018 වර්ෂවල පවිත්‍රතා සේවය පවත්වාගෙන යාමට ආයතනයක් තෝරා ගැනීම සඳහා 2017 මාර්තු මස සිදුකර තිබූ ප්‍රසම්පාදනයේ දී පවිත්‍රතා සේවය සපයන ආයතනයක වැදගත් සාධකයක් වන සේවක සංඛ්‍යාව පිළිබඳ සැලකිලිමත් වීමකින් තොරව ප්‍රසම්පාදනය සිදු කර තිබුණි.

**2.4** **වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම කොමිෂන් සභාව විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 ජුනි 06 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2016 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයේදි කොමිෂන් සභාව සතු වාහන පිළිබඳව සමීක්ෂණය සිදු කර නොතිබුණි.

**2.5** **විසඳා නොතිබුණු විගණන ඡේද**

2016 වර්ෂයේ 154(6) වාර්තාවේ 3.2 ඡේදය අනුව, කොමිෂන් සභාව විසින් මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**2.6** **කළමනාකරණ දුර්වලතා**

කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් ඉඩකඩ සහිත ගබඩාවක් නිශ්චිත ස්ථානයක ක්‍රමානුකූලව ගබඩා භාණ්ඩවලට නිසි ආරක්ෂාවක් ලැබෙන පරිදි ක්‍රමානුකූලව පවත්වාගෙන ගොස් නොතිබුණි.

**2.7** **කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ කොමිෂන් සභාවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2013 | පුනරාවර්තන | 163.57 | 161.71 | 1.86 | 1.14 |
| | මූලධන | 28.02 | 18.96 | 9.06 | 32.33 |
| | **එකතුව** | **191.59** | **180.67** | **10.92** | **5.70** |
| 2014 | පුනරාවර්තන | 183.37 | 180.06 | 3.31 | 1.80 |
| | මූලධන | 17.27 | 16.07 | 1.20 | 6.95 |
| | **එකතුව** | **200.64** | **196.13** | **4.51** | **2.25** |
| 2015 | පුනරාවර්තන | 245.50 | 225.16 | 20.34 | 8.29 |
| | මූලධන | 46.45 | 31.17 | 15.28 | 32.90 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **එකතුව** | **291.95** | **256.33** | **35.62** | **12.20** |
| 2016 | පුනරාවර්තන | 273.40 | 272.58 | 0 .82 | 0.30 |
| | මූලධන | 135.70 | 44.86 | 90.84 | 66.94 |
| | **එකතුව** | **409.10** | **317.44** | **91.66** | **22.41** |
| 2017 | පුනරාවර්තන | 332.36 | 330.91 | 1.45 | 0.44 |
| | මූලධන | 42.60 | 35.45 | 7.15 | 16.78 |
| | **එකතුව** | **374.96** | **366.36** | **8.60** | **2.29** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

සමාලෝචිත වර්ෂයේ මූලධන වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් සලසා තිබුණු රු.මිලියන 07 ක ප්‍රතිපාදනයෙන් සියයට 97ක් උපයෝජනයක් නොකර ඉතිරි වී තිබුණි.

**2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාල විෂය අංක 01001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 7.50 | 6.98 | 4.00 | 4.50 | 30.00 | 2.47 |

**2.9 අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාල විෂය අංක 01002 යටතේ අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |

| | | | | | |
|---|---|---|---|---|---|
| 150.00 | 3.11 | 2.00 | 2.69 | 275.00 | 18.95 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුමෙන් ලබා දී තිබුණු රු. 1,784,155 ක අත්තිකාරම් සම්බන්ධයෙන් නඩු තීන්දු ප්‍රකාශයට පත්කර තිබුණත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් තීන්දු ප්‍රකාශයට පත්කළ පසු වෙනත් අභියාචනා කිරීමට ඉඩ ප්‍රස්ථා ඇති බැවින් වර්ෂ 2 ක කාලයක් එම අත්තිකාරම් රඳවා ගැනීමට සිදු වී ඇති බව කොමසාරිස් ජනරාල්වරයා මා වෙත දන්වා ඇත.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට නඩු භාණ්ඩ නිලධාරියාගේ භාණ්ඩ ශේෂය ලෙස රු. 219,000 ක් වටිනා භාණ්ඩ වර්ග 10 ක් ඇතත් එම ශේෂය 2017 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මඟින් භෞතිකව තහවුරුකර නොතිබුණි.

## 2.10 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කොමිෂන් සභාව විසින් පහතින් දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, තවත් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය | නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි. |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

## 2.11 අනුකූල නොවීම

### රජයේ මුදල් රෙගුලාසිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව කොමිෂන් සභාවේ එක් දෙපාර්තමේන්තුවකින් වෙනත් දෙපාර්තමේන්තුවකට භාණ්ඩ මාරු කිරීමේදී දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම භාණ්ඩ බඩු ලේඛන පොතෙහි ඇතුළත් කර නොතිබුණු අතර, බඩු ලේඛන පොත නිසි පරිදි පවත්වා නොතිබුණි.

## 2.12 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් තම කොමිෂන් සභාවේ ස්වකීය රාජකාරි හා වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතු බව මුදල් රෙගුලාසි 133 මගින් අවධාරණය කර ඇතත් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.13 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

## 2.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කොමිෂන් සභාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 264.79 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 69 | 37 | 32 |
| (ii) | තෘතියික මට්ටම | 282 | 19 | 263 |
| (iii) | ද්විතියික මට්ටම | 582 | 242 | 340 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 130 | 73 | 57 |
| | | 1,063 | 371 | 692 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සේවක මණ්ඩල පුරප්පාඩු පිරවීම**

කොමිෂන් සභාව විසින් ද්විතික මට්ටමින් නිලධාරීන් 5ක් ද ප්‍රාථමික මට්ටමින් නිලධාරීන් 01ක් ද අනියම් හා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී පුරප්පාඩු 692 ක් පැවතුණු අතර 2018 වර්ෂයේදී ඉන් තනතුරු 200ක් යටපත් කිරීමට කටයුතු කර තිබුණි. ඉතිරි පුරප්පාඩු වලින් 332 ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් තිබුණු අතර තවදුරටත් පුරප්පාඩු 160 ක් පවතී.

(ආ) **කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

**--------------------------------**

කාර්ය මණ්ඩලය නිතිපතා පුහුණු කිරීමේ අවශ්‍යතාවක් ඇතත් කොමිෂන් සභාව විසින් එහි කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් පරිදි පුහුණු කර නොතිබුණි. පසුගිය වර්ෂ 5 ක පුහුණු කිරීම් හා හැකියා වර්ධන වැය විෂයයේ විස්තර පහත දක්වා ඇත.

| වර්ෂය | ප්‍රතිපාදනය | මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරියක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| 2013 | 500,000 | - | 500,000 | 72,700 | 427,300 | 85 |
| 2014 | 600,000 | - | 600,000 | 198,500 | 401,500 | 67 |
| 2015 | 600,000 | 51,000 | 549,000 | 327,750 | 221,250 | 40 |
| 2016 | 600,000 | 70,000 | 530,000 | 212,500 | 317,500 | 60 |
| 2017 | 600,000 | 82,000 | 518,000 | 385,000 | 133,000 | 26 |

**2.15 රජයේ නිලධාරීන් ඇප තැබීම**

**-------------------------------**

රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම, හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවැරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාවේ ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැබිය යුතු වුවත් එලෙස ඇප තබා නොතිබුණි.